## චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග

2024.11.04

ජ්‍යෙෂ්ඨ පොලිස්පති රවි සෙනෙවිරත්න මහතා,
ලේකම්,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
18 වන මහළ,
සුහුරුපාය,
බත්තරමුල්ල.

ලේකම්තුමෙනි,

<u>විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය – IV සම්බන්ධවයි.</u>

ඉහත කොට්ඨාශයේ නිලධාරීන් සහ පහසුකම් පිළිබඳ 2024.10.23 දින විශේෂ ආරක්ෂක දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති අජිත් හේසිරි මහතා විසින් මාගේ කොට්ඨාශයේ අධ්‍යක්ෂ/ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජගත් චන්ද්‍රකුමාර මහතාට, වාචිකව ලබාදුන් උපදෙස් වලට පිළිතුරු වශයෙන්, 2024.10.28 දින ජේ.පො.අ. චන්ද්‍රකුමාර මහතා විසින් සියලු විස්තර සහිත පිළිතුරු ලිපියක් එවන ලදි. (එම ලිපියේ පිටපත මේ සමග අමුණා ඇත.)

SSP චන්ද්‍රකුමාර මහතාගේ ඉහත ලිපියෙන් පැහැදිලි වන පරිදි අවම ආරක්ෂාව මා හට සැලස්වීම සඳහා දැනට සිටින නිලධාරීන් 50 දෙනා අවශ්‍ය බව සඳහන් කර ඇත.

එමෙන්ම විශ්‍රාමික ජනාධිපතිවරුන් පස්දෙනාගෙන් වැඩිම තර්ජන තිබෙන ජනාධිපති මා වන බව ද කරුණු දක්වා ඇත. ඝාතන උත්සාහයකට ලක්ව තුවාල ලැබූ එකම ජනාධිපති මම බව ද සඳහන් කරමි.

විශ්‍රාම ලබා සිටියත් කෙසේ හෝ ඝාතනය කරන බවට L.T.T.E ය විසින් 2006 සහ 2014 වසරවල ප්‍රසිද්ධියේ ප්‍රකාශ නිකුත් කර ඇති බව පොලිස් බුද්ධි වාර්තා වලින් අපට දන්වා ඇත.

කරුණු මෙසේ තිබියදී, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට හමුදා නිධාරීන් 63 ක් සහ පොලිස් නිලධාරීන් 180 කින් යුත් ආරක්ෂක නිලධාරීන් 243ක් සහ මෛත්‍රීපාල සිරිසේන මහතාට පොලිස් නිලධාරීන් 109 ක්, ගෝඨාභය රාජපක්ෂ මහතාට පොලිස් නිලධාරීන් 25ක් සහ හමුදා නිලධාරීන් 175කින් යුත් ආරක්ෂක නිලධාරීන් 200 කගේ ආරක්ෂකයින් ප්‍රමාණයක් සිටිය දී, මා හට සිටින ආරක්ෂක නිලධාරීන් 50 දෙනා 30කට අඩුකර ඇත.



27, නිදහස් මාවත, කොළඹ 07. දුරකථන : 2694372 ෆැක්ස් : 2667393

ජනාධිපති මැතිවරණ සමයේ තමන් බලයට පැමිණි විට ප්‍රභූ ආරක්ෂාව ලබා නොගන්නා බව ජවිපෙ නායකවරුන් ප්‍රකාශ කළ ද, ඔවුන් බලයට පත් වූවාට පසු වත්මන් රජයේ නායකවරුන්ට සිය ගණනින් සමන්විත ආරක්ෂක බලමුළු සපයා ගෙන තිබෙන්නේ, මෙම රජය ද අප රටේ ප්‍රභූවරුන්ට යම් කිසි ආරක්ෂාවක් තිබිය යුතු බව පිළිගෙන තිබෙන නිසා නොවේ ද?

කරුණු එසේ තිබිය දී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අජිත් හේසිරි මහතාගේ ඔක්තෝබර් 31 වන දිනැති ලිපියෙන් 50 දෙනෙකුගෙන් යුත් මාගේ ආරක්ෂක පිරිස 30ක් දක්වා අඩු කිරීමට නියම කර ඇත.

අනෙකුත් හිටපු ජනාධිපතිවරුන්ට 243 දෙනෙකු සහ 200 දෙනෙකුගෙන් සහ 109 දෙනෙකුගෙන් යුත් ආරක්ෂක කණ්ඩායම් ලබා දෙන අතර, චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනියට පමණක් ආරක්ෂකයින් 30ක් ලබා දීමට තීන්දු කළ නිර්ණායකය කුමක් දැයි මහත් ප්‍රෙහේළිකාවකි.

මාගේ ස්වාමිපුරුෂයා වන විජය කුමාරතුංග මහතා දේශපාලන හේතුන් මත ඝාතනය කළ පරිදිම, මා ද ඝාතනය කිරීමේ කුමන්ත්‍රණයක් පවති දැයි ඒ අනුව සැකයක් පහළ වී තිබේ.

මේ කරුණු පිළිබඳ ඔබගේ කාරුණික අවධානය යොමුවෙතැයි අපේක්ෂා කරමි.

මෙයට,

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග